ඇතැම් මාධ්‍ය සිය පුවත් වාර්තාවන් හි සිරස්තල යෙදීමේදී, අඩු වචන ප්‍රමාණයක් ඔස්සේ අදහසක් ලබාදීමේ අභිප්‍රායයෙන් යොදාගන්නා ඇතැම් යෙදුම් කෙතරම් උචිත භාෂා භාවිතයක් වන්නේ ද යන ගැටළුව පාඨකයින්ට මතුවිය හැක.
"ජාවාරමා", "ජාවාරම්මු" වැනි යෙදුම් ඊට උදාහරණ වේ.

2011 නොවැම්බර් 28 සහ 29 යන දිනයන්හි එකම සිදුවීමක් වාර්තා කරනා මාධ්‍ය කිහිපයක් තම සිරස්තල ඉදිරිපත් කර ඇති ආකාරය මෙහිදී විමසා බැලීම වටී. එහිදී පුවත්පත් දෙකක් "ජාවාරමා", "ජාවාරම්මු" වැනි යෙදුම් සිරස්තල තුළ භාවිතා කොට ඇති අතර, තවත් පුවත්පතක් "ජාවාරම්කරුවෝ" යන යෙදුම සිරස්තලය තුළ භාවිතා කර ඇත. කෙසේ නමුත්, මෙම පුවත් වාර්තාවන් තුනේම පුවත් අන්තර්ගතය තුළ සඳහන් වන්නේ "ජාවාරම්කරුවන්" යන්නයි.

බොහෝ විට පුවතකට සිරස්තල යොදන්නේ එම පුවත ලියන මාධ්‍යවේදියා විසින්ම නොවන බව, මින් පෙර අවස්ථාවන් හිදී අප හා අදහස් දැක්වූ මාධ්‍යවේදීන් විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු කරුණකි. එසේ වුවත්, සමාජයේ භාවිතා වන භාෂාව හැඩගැස්වීමට මාධ්‍ය මගින් ලබාදෙන දායකත්වය සලකා බලන විට, සිරස්තල තුළ සඳහන් වන "ජාවාරමා" වැනි යෙදුම් කෙතරම් දුරට යෝග්‍ය වන්නේද යන්න පැනයකි.

ඒ අනුව, වඩාත් උචිත යැයි ඔබ තෝරාගන්නේ මින් කුමන සිරස්තලයද?

1) මත්පැන් පානය කළ මත්ද්‍රව්‍ය ජාවාරමුන් තවත් මත්ද්‍රව්‍ය ජාවාරමකු සමග කෝලාහලයක
2) කුඩු-කසිප්පු ජාවාරම්මු ගැටී තුනක් රෝහලේ
3) මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ සූර් වී පාරේ යන අයට ගහලා